මහරගම මහල් නිවසක තරුණියක් දිවි අහිමි කරගැනීමේ පුවතක් විවිධ මාධ්‍ය මගින් වාර්තා කර තිබිණි (අරුණ, දිවයින, මව්බිම, ලංකාදීප පෙබරවාරි 14, 2022). එහිදී, දිවි අහිමි කරගැනීම් වාර්තාකරණයේදී පිළිපැදීම සඳහා හඳුන්වාදී ඇති මාර්ගෝපදේශයන් එම මාධ්‍ය අතින් උල්ලංඝනය වී තිබූ ආකාරය මෙසේයි.

දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කර ඇත.
දිවි අහිමි කරගත් අයගේ ඡායාරූපය සඳහන් කර ඇත.
දිවි අහිමි කරගත් අය "සුරූපී" යැයි දක්වා ඇත.
උපකාරක අංක සඳහන් කර නැත.

දිවි අහිමි කරගැනීම් වාර්තාකරණයේදී අනුකාරක දිවි අහිමි කරගැනීම් සිදුවීම වැළැක්වීමටත්, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු, මෙවැනි දිවි අහිමි කරගැනීමක් හා දිවි අහිමි කරගත් පුද්ගලයා හා තමන්ව අනන්‍ය කොට ගෙන සිතීම වැළැක්වීමටත්, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකුට උපදේශන සහාය ලැබීමට ඉඩක් ලබාදී ජීවිතයක් බේරා ගැනීමේ අරමුණ සඳහාත්, ඉහත සඳහන් උල්ලංඝනයන් නොකළ යුතු යැයි දිවි අහිමි කරගැනීම් වාර්තාකරණයේදී පිළිපැදීම සඳහා හඳුන්වාදී ඇති මාර්ගෝපදේශයන් මගින් පැවසේ.

එසේ නම්, එම මාර්ගෝපදේශයන්ට අනුකූලව, ප්‍රවේසම් සහගත ලෙස දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම මාධ්‍ය වගකීමක් ද වනු ඇත.

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Samaritans_Media...